සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Vi
විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Vi

# විශාඛා විද්‍යාලය - කොළඹ 05
# Visakha Vidyalaya, Colombo 05

## පළමුවන වාර පරීක්ෂණය 2023 (2023 ජූලි)
## First Term Test 2023 (July 2023)


| ගණිතය<br>**Mathematics** | 7 ශ්‍රේණිය<br>Grade 7 | *පැය දෙකයි මිනිත්තු 30 යි*<br>*Two hours 30 minitues* |
|---|---|---|

නම / අංකය : ...........................................................................................

1 කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

**1.** පහත රූපයේ සමමිතික අක්ෂ අඳින්න.



mathematica.lk

2. පැයට කිලෝමීටර 50ක වේගයෙන් යන මෝටර් රථයක් පැය $2\frac{1}{2}$ ක දී යන දුර සොයන්න.

3. P = {13610 යන සංඛ්‍යාවේ ඉලක්කම්}
ඉහත කුලකය අවයව මගින් ලියා දක්වන්න.

4. ව්‍යාපාරිකයෙක් වන සුනෙත්ගේ මාසික ආදායම රුපියල් එක් බිලියක හැට මිලියන පන්සීයකි. මෙම මුදල ඉලක්කමෙන් සම්මත ආකාරයට ලියා දක්වන්න.

5. පහත දැක්වෙන සංඛ්‍යාවලින් 6 න් ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.
2127, 5136, 4124, 2530, 1742, 2549

දෙවැනි පිටුව බලන්න]

6. අගය සොයන්න.

$(6 + 12)\ 5 + 100$

7. පහත දැක්වෙන වර්ෂ අතුරින් අධික අවුරුදු වන වර්ෂ තෝරා ලියන්න.

(i) ක්‍රි.ව. 1928 (ii) ක්‍රි.ව. 1800


(iii) ක්‍රි.ව. 1994 (iv) ක්‍රි.ව. 2400

8. A = {1 සිට 10 තෙක් ඇති ත්‍රිකෝණ සංඛ්‍යා}

ඉහත කුලකය වෙන් රූප සටහනක දක්වන්න.


9. 15.5 m දිග ලණු කැබැල්ලකින් 4.65 m දිග කොටසක් කපා ඉවත් කළ පසු ඉතිරි කොටසේ දිග සොයන්න.

10. පහත කෝණයේ බාහු හා ශීර්ෂ ලියා දක්වන්න.




mathematica.lk

11. පහත රූපයේ දැක්වෙන සමාන්තර රේඛා යුගල ලියා දක්වන්න.




mathematica.lk

12. ස්ථිතික කෝණ සඳහා උදාහරණ දෙකක් ලියන්න.

13. 60, 72 සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

14. සුළු කරන්න.

$\left(-\frac{7}{13}\right) + \left(\frac{3}{13}\right)$

15. හිස් කොටුවලට ගැළපෙන සංඛ්‍යා ලියන්න.

(i) $36 = \square^{2}$

(ii) $5^{4} = \square$

16. දින 255, මාස හා දිනවලින් ලියා දක්වන්න.


17. සෙනාලි පාඩම් කිරීම ආරම්භ කරන විට වෙලාව ප.ව. 3.00 පසුවී මිනිත්තු 6 යි. එම වෙලාව ජාත්‍යන්තර සම්මත ක්‍රමයට ලියන්න.

18. හිස් කොටුවලට ගැලපෙන අගයන් ලියන්න.

$$\begin{array}{r} 9\,8 \\ \times\ \ 4\,5 \\ \hline 4\,\square\,0 \\ 3\,9\,2\ \ \\ \hline 4\,4\,\square\,0 \\ \hline\hline \end{array}$$

19. කපිල මහතා 1989.12.30 දින තම රාජකාරි ස්ථානයේ වැඩ භාරගත් අතර 2022.02.25 දින විශ්‍රාම යන ලදී. ඔහුගේ සේවා කාලය වර්ෂ, මාස හා දිනවලින් දක්වන්න.

20. $O$ සිට $XY$ ට ලම්බ දුර කුමක් ද?




mathematica.lk


* *

## II කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.


1. (*a*) (i) සමමිතික අක්ෂ දෙකක් පමණක් ඇති රූපයක් ඇඳ සමමිතික අක්ෂ ලකුණු කර දක්වන්න. (ලකුණු 2)

(ii) පහත රූපවල සමමිතික අක්ෂ සියල්ල අඳින්න.




mathematica.lk

(ලකුණු 1)



(ලකුණු 2)

(*b*) වෙන්රූප සටහනකින් $S$ කුලකය නිරූපණය කර ඇත.




(i) $S$ කුලකයේ අවයව සඟල වරහන් තුළ ලිවීමෙන් කුලකය ලියා දක්වන්න. (ලකුණු 1)

(ii) අවයව නිශ්චිතවම හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් මගින් $S$ කුලකය ලියා දක්වන්න. (ලකුණු 2)

(*c*) P = {"BASKET BALL" යන වචනයේ අකුරු}
ඉහත කුලකය වෙන් රූප සටහනක දක්වන්න. (ලකුණු 2)

2. (*a*) පරිප්පු 500 g ක මිල රු. 150කි. පරිප්පු $2\frac{1}{4}$ kg ක මිල සොයන්න. (ලකුණු 2)

(*b*) පහත දැක්වෙන සංඛ්‍යාත්මක ප්‍රකාශන සුළු කරන්න.

(i) $5 \times 10 \div 5 - 3 \times 3$

(ii) $8 + 6 \times 35 \div 5$ (ලකුණු 4)

(*c*) කුලී ත්‍රිරෝද රථයක් ගාස්තු අයකරන්නේ පළමු කිලෝමීටරයට රුපියල් 100 ක් ද ඊට වැඩි සෑම කිලෝමීටරයකටම රු. 70 බැගින් වන පරිදි ය. මෙම රථයෙන් කිලෝමීටර 15 ක් ගමන් ගත් අයෙකු ගෙවිය යුතු මුළු මුදල සඳහා සංඛ්‍යාත්මක ප්‍රකාශනයක් ලියා එය සුළු කර අගය සොයන්න. (ලකුණු 4)

3. (*a*) (i) 38 ☐ 3 යන සංඛ්‍යාව 3 හි ගුණාකාරයක් නම් හිස් කොටුවට ගැලපෙන ඉලක්කම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) 126 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියා එහි ප්‍රථමක සාධක සියල්ල ලියන්න. (ලකුණු 3)

(iii) හිස්තැනට සුදුසු වචනය යොදන්න.

සංඛ්‍යා දෙකක් හෝ කිහිපයක් බෙදෙන විශාලතම සංඛ්‍යාව එම සංඛ්‍යාවල .............................. ලෙස හැඳින්වේ. (ලකුණු 2)

(*b*) ආගමික සිද්ධස්ථානයක සීනු 3 ක් මිනිත්තු 6 කට මිනිත්තු 8 කට හා මිනිත්තු 12 කට වරක් නාද වේ. පළමු වතාවට සීනු 3 ම පෙ.ව. 6.00 ට නාද වූයේ නම් තුන්වන වතාවට එකවර සීනු නාද වන්නේ කවර වෙලාවක දී ද? (ලකුණු 3)

4. (*a*) වීරසූරිය මහතාගේ උපන්දිනය 1984.07.15 වන අතර ඔහුගේ පුතා වන තේනුජ ඉපදුනේ 2011.03.09 වන දින ය.

(i) තේනුජ ඉපදුන වර්ෂයට ආසන්නතම අධික අවුරුද්ද ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) වීරසූරිය මහතා ඉපදුනේ කුමන ශතවර්ෂයේ ද? (ලකුණු 2)

(iii) වීරසූරිය මහතා තම පුතාට වඩා කොපමණ වැඩිමල් ද යන්න වර්ෂ, මාස හා දින ඇසුරින් දක්වන්න. (ලකුණු 2)

(*b*) (i) එකතු කරන්න.

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| 7 | 8 | 18 |
| + 5 | 6 | 22 |
| | | |

(ලකුණු 2)

(ii) දින 250, මාස හා දිනවලින් දක්වන්න. (ලකුණු 2)

5. (*a*) (i) 81 පාදය 3 වූ බලයක් ලෙස ලියා දක්වන්න. (ලකුණු 2)

(ii) $6^2$ හි පාදය හා දර්ශකය මාරු කළ විට ලැබෙන බලයේ අගය සොයන්න. (ලකුණු 2)

(iii) $a = 2$ හා $b = 3$ ලෙස ගෙන $2ab^3$ හි අගය සොයන්න. (ලකුණු 2)

(*b*) (i) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් අගය සොයන්න.
$(-3) + (+7)$ (ලකුණු 2)

(ii) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් තොරව අගය සොයන්න.
$\left(+\frac{7}{8}\right) + \left(-\frac{3}{8}\right) + \left(+\frac{1}{8}\right)$ (ලකුණු 2)

6. (*a*) (i) දිග 6 cm ක් වූ $XY$ සරල රේඛා ඛණ්ඩය අඳින්න. (ලකුණු 2)

(ii) එම සරල රේඛා ඛණ්ඩය මත නොපිහිටන $P$ නම් ලක්ෂ්‍යයක් ලකුණු කරන්න. (ලකුණු 1)


(iii) විහිත චතුරස්‍රය හා සරල දාරය භාවිතා කර, එම $P$ ලක්ෂ්‍ය හරහා යන $XY$ සරල රේඛා ඛණ්ඩයට සමාන්තර වූ රේඛාවක් අඳින්න. (ලකුණු 2)

(*b*) (i) රූපයේ ලකුණු කර ඇති තොරතුරු අනුව පහත එක් එක් කෝණය කුමන වර්ගයේ කෝණයක් දැයි වෙන වෙනම ලියන්න. (ලකුණු 3)

$A\hat{B}C$ = ……………………

$B\hat{C}D$ = ……………………

$C\hat{D}E$ = ……………………




(ii) $B\hat{C}D$ කෝණය මැන අගය ලියන්න. (ලකුණු 2)

mathematica.lk

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**